විවිධ

හුදෙකලාව

මිනිසත් බව ලබමින් මෙලොවට බිහි වන අප හැමදෙනාම ප්‍රථමයෙන් පවුල් ඒකකය තු-ළ සාමාජිකත්වය ලැබීම සාමාන්‍ය ස්වභාවයයි. එතැන් සිට සෑම දරුවෙක්ම තම දෙමාපිය, සහෝදර සහෝදරියන්ගෙන් සමන්විත පවුල ඇතුළත සමාජානුයෝජනයට ලක් වෙමින් ජීවිතය අරඹයි. ඒ අනුව මිනිසුන් වන අපි හැමදෙනාම උපතේ සිට මරණය දක්වාම සෙසු අය ඇසුරෙහි දිවි ගෙවන්නෙමු. "තනිවයි උපන්නේ . තනිවයි මැරෙන්නේ.." යනුවෙන් කියවෙන ප්‍රකට ගීතයෙහි අරුත ද සනාථ කරමින් අපගේ උපත සහ මරණය යන අවස්ථාවන්හිදී අපි හුදෙකලා ජීවීහු වෙමු. ඒ හැරුණ විට ජීවිතය පුරාම අපි, නෑ මිතුරන්, යහළු හෙහෙළියන් ඇතුළු පුළුල් සමාජයක සාමූහිකව ජීවත් වන සත්ව කොට්ඨාසයක් වන්නෙමු. තතු එලෙස බැවින් අපගේ දිවි පැවැත්මෙහි මූලික ලක්ෂණයක් වන සාමූහික බව මිනිසා සම්බන්ධයෙන් පවත්නා සනාතන ස්වභාවයකි. මිනිසා කිසි සේත්ම හුදෙකලා සත්වයෙක් නොවන බව විද්වත් මතයක් ලෙසින් පිළිගන්නා අපට යම් විටෙක හුදෙකලාව අත් විඳින්නට වුවහොත් එහි කටුක බව, දුක්ඛිත බව නොඅඩුවම දැනෙනු ඇත.

අප හුදෙකලා වන්නේ තනිවම සිටින විට පමණක්ම නොවේ. තනිවම සිටියදී අපි ශාරීරිකව මෙන්ම මානසිකව ද හුදෙකලා වෙමු. එහෙත් මනසින් හුදෙකලා වීම, පිරිසක් මාධ්‍යයේ වුව සිදු විය හැකිය. ජනාකීර්ණ සමාජ වටපිටාවකදී කෙනකුට හුදෙකලා බවක් දැනෙන්නට පුළුවන. සිය රටත් නෑ හිතවතුනුත් හැර දමා විදේශගත වන්නකුට අලුත් පරිසරය කොතරම් සෙනග පිරුණු, කලබලකාරී එකක් වුවද එහිදී දරාගත නොහැකි තරම් තනිකමක්, පාළුවක් දැනෙන්නට පුළුවන. ප්‍රේම සම්බන්ධතාවක් යහපත් ලෙස පවතින විටකදී පෙම්වතුන්ට එකිනෙකාගෙන් ඈත්ව සිටින්නට සිදු වුවහොත් තනිකම, පාළුව ඉවසාගත නොහැකි වන තරමිය. සිය දූ පුතුන් හිවසින් බැහැරව ජීවත් වන විටදී දෙමාපියන්ට දැනෙනුයේ ද මෙවැනිම හුදෙකලා බවකි. ඇතැම් විටක පෙම්වතුන් යුවළක් හේදගින්න වී එම සබඳතාව නවත්වා දැමුවහොත් ඔවුන් තුළ ද උද්ගත වන පාළුව, කාන්සිය වචනවලට නගන්නට නොහැකි තරම් ප්‍රබල වනු ඇත.

ඇර්නස්ට් හෙමිංවේ නම් සුප්‍රකට ඇමෙරිකානු ලේඛකයා පළ කළ අරුත් බර අදහසක් නම්, "ආදරය සුන්දර වන අතර අහිමි වූ ආදරය පුද්ගලයා තුළ සන්තාපයක් ජනිත කරවන බවයි." ආදරයෙන් බැඳී සිටියද එකිනෙකා යළි යළිත් මුණගැසීමේ උනන්දුව ප්‍රබල හැඟීමකි. එවන් දෙදෙනෙකුගේ ආදර සම්බන්ධතාව බිඳ වැටුණහොත් එයින් මතු වන අනුවේදනීය හැඟීම් ද එතරම්ම ප්‍රබල වෙයි. හෙමිංවේ විසින් රචනා කරන ලද විශිෂ්ට නවකතා අතර, 'ද සන් ඕල්සෝ රයිසස්' (හිරු උදාවෙයි), 'ඉ ෆෙයාවෙල් ටු ආර්මිස්' (සුද අවිවලින් සමුගැනි මක්), 'ෆෝ හූම් ද බෙල් ටෝල්ස්' (සීනුව නාද වන්නේ කවුරුන් වෙනුවෙන්ද) යනාදී කෘතිවලින් ඔහු ප්‍රතිනිර්මාණය කර ඇත්තේ ද, එක් අතකින් බලන විට ආදරයේ සුන්දරත්වය හා බිඳ වැටුණ ආදරයේ වේදනාකාරී බවයි, නැතහොත් එයින් නැගී එන පාළුව, කාන්සිය සමග හුදෙකලා බව පුද්ගලයාගේ මනසට පීඩාකාරී වන බවයි.

හුදෙකලා බවට බොහෝ දුරට පාදක වන්නේ ආදරය ලබන්නට, ආදරය විඳින්නට මෙන්ම ආදරය ප්‍රකාශ කරන්නට ද අන් අය තම සමීපයේ නොමැති වීමයි. අප දන්නා පරිදි ආදරය යන්න විවිධාකාර සම්බන්ධතා හා බැඳීම් ලෙස හඳුන්වා දිය හැකිය. දෙමාපියන් හා දරුවන් අතර පවත්නා ආදරය, අඹු සැමි ආදරය, ගුරු ශිෂ්‍ය සෙනෙහස, හිතමිතුරන් අතර පවතින බැඳීම යන මේ කවර අංශයකින් ගෙන බැලුවද ආදරය ප්‍රබල හැඟීම් මතු කරන සම්බන්ධතාවකි. විශේෂයෙන්ම අඹුසැමි ආදරය හා අත්වැල් බැඳගත් අතික් අනුවේදනීය හැඟීම් නම් එකිනෙකාගෙන් වෙන්ව සිටියදී, එය සුළු වේලාවක් වුව, එම අවස්ථාවේදී තම සිත තුළට දැනෙන දැඩි පාළුව හා හුදෙකලාවයි. විශිෂ්ට නිර්මාණ කරුවන් එවන් අවස්ථා කොතරම් දක්ෂ ලෙස හා සංවේදී අයුරින් තම රචනා මගින් පළ කර ඇද්ද යන්නට හොඳ නිදසුනක් නම්, ශ්‍රී ලාංකික රසිකයන්ගේ හද බැඳගත් ප්‍රවීණ ගායකයකු වන සුනිල් එදිරිසිංහ විසින් ගයෙන මතු දැක්වෙන රසවත් ගීතයයි.

"කළේ පැන් ඇත නැවුම් රහ නැත
මොකද මන්දා ළිඳට වූයේ
පුළුස්සාගත් රොටිය කර වී
මොකද මන්දා ලිපට වූයේ

හදාගත් ලුණු මිරිස රහ නැත
මොකද මන්දා දිවට වූයේ
සැලේ ගහ කොළ සුළඟ ඇත එද
සිහිල කොයි අත ගියාදෝ

පුරුදු නිවහන නුහුරු වී නම්
කාට මේ ගැන කියන්නෙම්
කාට මේ ගැන කියන්නෙම් මම
බිරින්දෑ නෑ ගම් ගොහිං"

ප්‍රකට ගීත රචකයකු- වන, කේ. ඩී. කේ. ධර්මවර්ධනගේ පද රචනයෙන් ද එවන් ප්‍රබල පද රචනයකට විශිෂ්ට සංගීත නිර්මාණයක් සැපයූ රෝහණ වීරසිංහ නිර්මාණ කරුවාගේ රසවත් තනු නිර්මාණයෙන් ද කවදත් සිංහල සහෘදයන්ගේ මනසට රස ආකාරයක් බඳු ගීත ගායනයෙන් ප්‍රසිද්ධියට පත් වී සිටින සුනිල් එදිරිසිංහ නම් වූ ගායකයාණන්ගේ සුමිහිරි ගායනයෙන් ද මෙම ගීතය ගැයෙන විට අප තුළ මතු වන හැඟීම් විවිධාකාරය. ගීතය අවසානයේදී කථකයාගේ දුක්ගැහවිල්ල ලෙස පළ වනුයේ වෙනදා තමාට ලැබූ මිහිරි ආහාරපාන සියල්ල අද නිරසව ගොස් ඇති බවයි. වෙනදා තමන් පානය කළ පැන් බීඳෙහි නැවුම් රසය අද දැනෙන්නේ නැත. එකම ළිඳෙන් ගත් ජලය ඔහුට අද නැවුම් ජලය නොවේ. බිරිඳ නිවසේ සිටිය දී ආහාරයට සකසා දෙන රොටිය අද පිළිස්සී ගොස් ඇත. තලාගත් ලුණු මිරිස රස නැත්තේ ගලට කුමක් වී ඇති නිසාද? වෙනදාවත් හමන මඳ නල අද ගතට සිසිලසක් නොදෙන්නේ ඇයි? මේ දුක කාට කියන්නද? තම දුක් වේදනා අසන්නට, දැනෙන්නට සිටි ආදරණීය බිරිඳ අද නිවසේ නැත . ඇය ගමේ ගොස්ය. මේ සියලු දැනීම්, විඳීම්වලට හේතුව වී ඇත්තේ වෙනදා නිවස තුළ රැඳෙමින් තම අවශ්‍යතා සියල්ල සරිකර දුන් ආදරණීය බිරිඳ නිවසේ නැතිකමයි.

ආදරණීය සැමියකුට තම බිරිඳ අතින් නිවසේදී ඉටු කෙරෙන අනන්ත අප්‍රමාණ කාර්යයන්හි අගය, ඒවා හිතිපතා සිදු වන විටදී එතරම් දුරට නොදැනෙනු ඇත. මොහොතකට හෝ දිනකට හෝ ඇය නිවසේ නොසිටි නම් එයින් ඇති වන අඩුව ඔහුට දරාගත නොහැකි තරමිය. ඇය තමන් අවට නොසිටීමෙන් ඇති වන පාළුව, හුදෙකලාව මෙම නිර්මාණ කරුවා සැබවින්ම කාව්‍යමය අයුරින් රචනා කොට ඇත. සියලු විත්දනයන්ට සිත මුල් වන බව බුදු දහමේ සඳහන් වන,

"මනෝ පුබ්බංගමා ධම්මා . මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චෙ පදුට්ඨේන . භාසති වා කරොතිවා ..."

යනාදී වශයෙන් දැක්වෙන ධම්මපද ගාථාවලට අනුව පුද්ගලයකුගේ සෑම සියලු ක්‍රියාවකටම මුල් වන්නේ සිතයි. යහපත් සිතින් කරන යහපත් දේ මෙන්ම දුෂ්ට සිතින් කරන අයහපත් දේ ද එම පුද්ගලයා පසුපස ඇදී එයි. අයහපත් සිතින් කරන්නා වූ ක්‍රියාවන්හි අයහපත් ප්‍රතිඵල පුද්ගලයා පිටුපසින් ඇදී එන්නේ කරන්තයක් ඇදගෙන යන නොනුගේ පිටුපසින් ඇදී එන රිය සක මෙහි. එහිදී ගැලවීමක් ඇත්තේම නැත. යහපත් සිතින් කරන ක්‍රියාවල ප්‍රතිඵල පුද්ගලයාගේ සෙවණැල්ල මෙන් සමීපයෙහිම, ඔහු නොහැරම සිටියි. මෙලෙසින් ගත් කල, සියල්ලටම පාදක වන සිත, පුද්ගලයා විසින් කරනු ලබන සියලුම දේට මුල් වන සාධකයයි.

ආදරය, සෙනෙහස අප සිත් තුළ, හදවත් තුළ ඇති වන හා පවතින යහපත් හැඟීමිය. එවන් සුහද හැඟීම් හා බැඳීම් සමග ජීවත් වන්නට කවුරුත් පාගේ කැමති වන්නාහ. එසේ නිබියදී එම සුන්දර හැඟීමෙන් විනිර්මුක්තව සිටින්නට කෙනකුට සිදු වුවහොත් එය හදවතට වේදනා දනවන්නකි. කාත් කවුරුත් නොමැතිව, ජීවිතයේ අසරණ වී, හුදෙකලා වී සිටින පුද්ගලයකුට අතැතැම් විට තිරිසන් සතකුගෙන් ලැබෙන යහපත් ප්‍රතිචාරයක් හෝ ස්පර්ශයක් පවා මොහොතකට හෝ එම පාළුව කමාලන්නට උපකාරී වනු ඇත. අපගේ නිර්මාණ කරුවන් තමන්ම විඳගත් හෝ තමන් දන්නා හඳුනන අන් කිසිවකු-ට විඳන්නට සිදු වූ හෝ එබඳු අත්දැකීම්, රමණීය ලෙස කවියට නගා ඇති ආකාරයට ගිඳසුන් ද අපගේ සාහිත්‍ය කලාවන්ගෙන් සොයාගත හැකිය.

සිසිර කුමාර මානික්කආරච්චි කවියා එවන් සංවේදී අත්දැකීමක් අපූරු ලෙස කවියට නගා ඇති අවස්ථාවක් ඔහු නිර්මාණය කළ, 'අමුත්තා' නම් කවි පෙළෙන් දැකගත හැකිය.

සම්මානිත හොවාරිය
කුසුමා කරුණාරත්න

"ඇඳුරු මහ ගන වලා පෙළකින්
ගිලින ලද නිල් වන් අහස් ගැබ
අකුණු සැරයෙන් වදින පහරට
මිරිකී මිරිකී හඬා වැළපේ"

කවියකු සතු කුසලතාවක් වන ධ්වනිතාර්ථ නැංවීමේ හැකියාව මෙම ලේඛකයා තුළ ඇති බව පළමු පද හතරෙන්ම ස්ඵුට වී ඇත. ඔහු සිතන සාමාන්‍ය අහස් ගැබ පැහැදිලි නිල්වන් එකකි. එනම්, සාමාන්‍ය මිනිස් සිතක ස්වභාවයෙන් පැවතිය හැකි, දුක් දොම්නස් අවුල් වියවුල් ආදියෙන් තොර පැහැදිලි තත්වයයි. එවන් නිල්වන් අහසේ ගැබට දැන් සිදු වී ඇත්තේ කුමක්ද? අඳුරු වූ මහ ගන වලාකුළකින් එය ගිලගෙන ඇත. කථකයාගේ සිත ද පාළුව, හුදෙකලාව නමැති අඳුරු වැහිවලාකුළකින් වැසී ගොස් ඇත යන අරුත් දෙන මෙහි තව දුරටත් එම ධ්වනිතාර්ථ නැංවෙන සේ "අකුණු සැරයෙන් වදින පහරට මිරිකී මිරිකී හඬා වැළපේ" යන පද සංයෝජනය සමග එම අර්ථ ධ්වනිය, ශබ්ද, ධ්වනියක් ද සමග එක් වී ඇත. 'මිරිකී, මිරිකී' යනුවෙන් යෙදී ඇති තැන්හිදී පාළුව හා හුදෙකලාව විසින් ඔහුගේ සිත දැඩි සේ මිරිකෙමින් හඬා වැළපෙන ආකාරය රසික මනසට දැනෙන්නට සැලැස්වීමට කවියා සමත් වී ඇත. එවන් පරිසරයක අඳුර සමග මතු වන භයංකර විලාසය තව තවත් වර්ධනය කරවමින් කවියා,

"තුරුණු රුක්ගිස් අඹරවාගෙන
අරටු ගස්මුල් උගැ-ලුවාගෙන
පැසුණ මොර ලොව දහස් ගණනින්
පොළෝ තලයට පහර දෙනු වැනි"

මොර සූරන වැස්සකදී සැබවින්ම සිදු වන තත්වයක් මෙහි වර්ණනා කෙරෙයි. තරුණ රුක්වල මුදුන් අඹරවාගෙන යන තරම් සැඩ සුළඟ ප්‍රබල වී ඇත. අරටු සහිත ගස්මුල් උගැ-ලුවා දමමින් වසින මේ මහා වැස්ස පොළවට වැටෙන්නේ විශාල වැසි බිංදු ලෙසිනි. ගස්වල පැසී, ඉදී ඇති මොර, ලොව වැනි ගෙඩි වර්ග දහස් ගණනින් පොළෝ තලයට පහර දෙන්නාක් වැනිය. කාව්‍ය නිර්මාණයකදී උපමා භාවිතයෙහිලා කවියකු සතු කුසලතාව මතු කර ලමින් මෙවැනි උපමා ආදිය යොදා ගැනීමට මාණික්කආරච්චි කවියා සමත් වන අතර ඉදිරියට හෙළි කරන තත්වයට ඉතා හොඳ පසුබිමක් මෙම පරිසර යෙදුම්වලින් සකසා ගැනීමට ද ඔහු සතු කුසලතාව උපයෝගී වී ඇත.

මෙබඳු තද වැසි පවතින අවස්ථාවකදී මුවා වෙන්නට තැනක් නොමැතිව සෙවණක් සොයාගෙන දිගු මාවතක් ඔස්සේ ඉදිරියට ගාටගාටා ඇදෙන බැල්ලකගේ දර්ශනය දෙසට අනතුරුව සහෘදයා මනසින් කැඳවාගෙන යාමට කවියා යොමු වී ඇති ආකාරය මෙසේය.

"මුවහ වෙන්නට තරම් සෙවණක්
නොමැති දිගු මාවතක් ඔස්සේ
වසින මොර දොඹ පහර කාගෙන
ගාටගාටා ඇදෙන බැල්ලක"

කිසිදු හවිහරණක් නැතිව ජීවිතය ගෙවන මිනි සුන් පමණක් නොව තිරිසන් සතුන්ට පවා අත් විඳින්නට වන දුක් කන්දරාව අප්‍රමාණය. තද වැස්සෙන් බේරී මුවා වෙන්නට තැනක් නැතිව ඉදිරියට ඇදෙන බැල්ල, පාළුව, හුදෙකලාව අත් විඳින මිනිසකුගේ අසරණ ජීවිතයට සමාන වන තරමිය. මෙම දර්ශන දකින හෝ මනසින් සිහිපත් කරන කථකයා අනික් පසින් එළෙසින්ම ජීවිතයේ තනි වී සිටින මහල්ලකුගේ රුවක් රසික සිත් තුළ මවයි.

"පාළු මණ්ඩියේ එහා කෙළවර
පැළ්පතක් ඇත පාර අයිනේ
ගරා වැටෙමින් තිබෙන පැල තුළ
පරාජිරීණ මහලු මිනිසෙකි"

තිරිසන් සතුන්ට පමණක් නොව ජීවිතයේ අසරණ බවේ අන්තයට ගොස් සිටින දුප්පත්, මහලු මිනිසකුට වුව තනිකම, පාළුව හා හුදෙකලාව දැඩි සේ දැනෙන ආකාරය මෙහි දැක්වෙයි. කවියා මෙහිදී යොදාගෙන ඇති වදනක් වදනක් පාසාම කවි පෙළේ මුඛ්‍ය තේමාව ඉස්මතු වන සංකේත නිර්මාණය කරයි. 'පාළු මණ්ඩියේ' යන යෙදුමෙන් මහලු මිනිසාගේ ජීවන තත්වය මෙන්ම මානසික තත්වය ද සංකේතවත් කර දක්වා ඇත. බැල්ල මෙන්ම මහල්ලාද කාත් කවුරුත් නැති අසරණ පුද්ගලයෙකි. ඔහු ජීවත් වන පැල්පත ද ඇත්තේ පාළු මණ්ඩියේ එහා කෙළවරේය. එහෙම්, කිසිවකුගේ ඇස